# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1937/3 - 2015 ඔක්තෝබර් මස 19 වැනි සඳුදා - 2015.10.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රේගු නිවේදනය සඳහා සංශෝධන

රේගු ආඥාපනත (235 වන අධිකාරය)

**2003 අංක 2 දරන රේගු (සංශෝධිත) පනතේ ''ඉ'' උපලේඛනයේ 10 වන වගන්තිය යටතේ වන නියෝගය**

2003 අංක 2 දරන රේගු (සංශෝධිත) පනතේ ''ඉ'' උපලේඛනයේ 10 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල් අමාත්‍ය රවී කරුණානායක වන මම, 2015 සැප්තැම්බර් 22 දිනැති අංක 1933/16 දරන ගැසට් නිවේදනය පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට මෙයින් නියම කරමි.

01. 2015 සැප්තැම්බර් 22 දිනැති අංක 1933/16 දරන ගැසට් නිවේදනය මගින් කරන ලද නියෝගය ක්‍රියාත්මක වීම 2015 ඔක්තෝබර් 19 වැනි දින සිට වන අතර, එය නැවත දන්වන තෙක් අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතුය.

02. 2003 අංක 2 දරන රේගු (සංශෝධිත) පනතේ ''ඉ'' උපලේඛනයේ 10 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද, 2015 පෙබරවාරි 10 වැනි දිනැති අංක 1901/3 දරන ගැසට් නිවේදනය 2015 ඔක්තෝබර් 18 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයින් අවලංගු කරමි. කෙසේ වුවද, 2015 ඔක්තෝබර් 18 වන දින හෝ ඊට පෙර ප්‍රතිෂ්ඨාපනය කරන ලද සහ පසුව සංශෝධනය නොකරන ලද ණයවර ලිපිය (ලිපි) පදනම් කර ගෙන ආනයනය කරන ලද මෝටර් වාහන වල රේගු වටිනාකම තීරණය කිරීම සඳහා, 2015 පෙබරවාරි 10 වන දිනැති අංක 1901/3 දරන ගැසට් නිවේදනය අවලංගු සේ නො සලකා කටයුතු කළ යුතු වේ.

රවී කරුණානායක,
මුදල් අමාත්‍ය.

2015 ඔක්තෝබර් මස 19 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

11 - 69

1A - PG 2656 — 481 (2015/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*